දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2025

මගේ අංකය: DAPH/VRA/ 1/1 /8 /10/5
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2025.03. 20

අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය/ සත්ත්ව අභිජනන/ පශු අණු පනත් හා නීති/ පශු සම්පත් සැලසුම් හා ආර්ථික/ මානව සම්පත් සංවර්ධන/ පශු පර්යේෂණ)
සියලුම පළාත් අධ්‍යක්ෂවරුන්
දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්
දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරීන්
පශු විමර්ශන නිලධාරීන්
සියලුම කොට්ඨාශ භාර පශු වෛද්‍යවරුන්

<u>කුකුළු අභිජනන ගොවිපලවල්/ කුකුළු බීජ රක්කනාගාර ලියාපදිංචි කිරීම සහ අදාළ සෞඛ්‍ය තත්ත්වයන් පවත්වා ගෙන යාම.</u>

1959 අංක 92 ක්වූ සත්ත්ව රෝග පනතේ 16 වන වගන්තිය යටතේ මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සියලුම කුකුළු අභිජනන ගොවිපලවල්/ බීජ රක්කනාගාර ලියාපදිංචිය හා ලියාපදිංචිය අලුත් කිරීම සහ අදාළ ජෛව ආරක්ෂණ ක්‍රමවේද පවත්වා ගෙන යාම සඳහා 2025.04.01 දින සිට පහත පරිදි ක්‍රියා කළ යුතු වේ.

1. ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම

අ. කුකුළු අභිජනන ගොවිපලක්/ කුකුළු බීජ රක්කනාගාරයක් ඇතිකිරීම හා ලියාපදිංචි කිරීම සඳහා පරිශිෂ්ටය 1 පරිදි අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

ආ. එවැනි සෑම අයදුම්පතක්ම එම පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය නිලධාරී විසින් එම පරිශ්‍රයේ ජෛව ආරක්ෂාව පිළිබඳ පරීක්ෂා කර බලා ඔහුගේ හෝ ඇයගේ නිර්දේශය සමඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රය නිසි ලෙස ඉදිරිපත් කර තිබේ නම් අධ්‍යක්ෂ සත්ත්ව සෞඛ්‍ය විසින් පත් කරන ලද දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කමිටුවක් මගින් එම පරිශ්‍රයට ගොස් ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ යුතු අතර එහිදී ලබා දී ඇති නිර්ණායක අනුව කමිටුව සෑහීමකට පත් වේ නම් ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කිරීම හෝ නිර්දේශ ලබා දීමට අවශ්‍ය වෙනත් වාර්තා සැලසුම් ආදිය ඉදිරිපත් කරන ලෙස දැනුම් දීමට හෝ නිර්දේශ නොකිරීමට කටයුතු කළ හැක. යම් ගැටළු කාරී අවස්ථාවකදී අධ්‍යක්ෂ සත්ත්ව සෞඛ්‍ය මගින් දෙවන ස්ථානීය පරීක්ෂාවක් කිරීමට නියම කරනු ඇත.

ඇ. 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත ප්‍රකාරව එසේ නිර්දේශ කළ හැක්කේ;

- ජෛව ආරක්ෂණ ක්‍රමවේද වලට අනුකූල වීම.
- භෞතික පහසුකම් පරිශ්‍රය තුළ ප්‍රමාණවත් වීම.
- ප්‍රහුණු සහ පළපුරුදු පිරිස් නිසි ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණයට දායක වීම.

යන ප්‍රධාන කරුණු පිළිබඳව ප්‍රකාශයක් මගිනි.

ඈ. ලියාපදිංචි ගොවිපල සඳහා ලියාපදිංචි සහතිකය, අධ්‍යක්ෂ (පශු අණු පනත් හා නීති) මගින් පරිශිෂ්ටය 2 පරිදි නිකුත් කෙරේ. එසේ ක්‍රියාත්මක කරන ලද ලියාපදිංචිය එම ලියාපදිංචි කිරීමේ දින සිට වසරක් සඳහා වලංගු වන අතර ඒ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද පරිශිෂ්ටය 3 පරිදි අයදුම්පතකින් ලියාපදිංචිය අලුත් කළ යුතුය.

ඉ. අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු/ ඇය විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට එවැනි පරිශ්‍රයකට ගොස් පරීක්ෂා කිරීම සුදුසු යැයි හැඟෙන සෑම අවස්ථාවකම එසේ පරීකෂා කිරීම සඳහා නීතිමය අවසරය ඇත.

2. කුකුළු අභිජනන ගොවිපල/ කුකුළු බීජ රක්කනාගාරය පිහිටි ප්‍රදේශය හා කලාපය හඳුනාගත් කුකුළු රෝග වලින් තොර කලාපයක් ලෙස පවත්වාගෙන යාම.

අ. කුරුළු උණ රෝගය සහ නිව් කාසල් රෝගය (රැනිකට් රෝගය) හෝ අවස්ථානුකූලව නම් කරන ලද රෝග සඳහා අරියව කිලෝ මීටර් 10 ක වපසරියක් පරීක්ෂා කිරීම, අඛණ්ඩ ක්‍රියාකාරී රෝග ආවේක්ෂණය, නිරීක්ෂණය සහ අධීක්ෂණය සිදුකළ යුතුය.

ආ. ඉහත අඛණ්ඩ ක්‍රියාකාරී රෝග නිරීක්ෂණ කටයුතු සඳහා සාම්පල ලබා ගැනීම හා සම්බන්ධ කටයුතු වාර්ෂික පරීක්ෂා කිරීමේ සැලැස්ම අනුව සිදුවිය යුතුය.

ඇ. එම කුකුළු අභිජනන ගොවිපල/ කුකුළු බීජ රක්කනාගාර ආනයනික සතුන් සඳහා නිරෝධායනික මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වන නිසා ඒ ආශ්‍රිතව, අරියව කිලෝ මීටර් දෙකක (02) වපසරියක් තුළ වාණිජ වෙනත් කුකුළු ගොවිපලවල් පිහිටුවීම, ලියාපදිංචි කිරීම සඳහා ලියාපදිංචි කිරීමේදී නිර්දේශ ලබා දීම හෝ පරිසර බලපත්‍ර හෝ ව්‍යාපාර බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා නොදිය යුතුය.

ඈ. කි.මී. 02 ක අරිය ප්‍රදේශයෙන් පිට පවත්වාගෙන යන කුඩා (<200) හා ගෘහාශිත කුකුල් ගොවිපල සඳහා එන්නත්කරණ (රැනිකට්) වැඩසටහන් නොමිලේ ක්‍රියාත්මක කලයුතු අතර >200 ගොවිපල සඳහා සහන මිලට එන්නත් ලබා දීම කළ යුතුය.

ඉ. සියලු ගොවිපල පෙව ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කලයුතු වේ.

3. ලියාපදිංචි වූ සහ ලියාපදිංචිය අලුත් කළ කුකුළු අභිජනන ගොවිපල/ කුකුළු බීජ රක්කනාගාර පිළිබඳ ආයතනයේ නම, ලිපිනය, අක්ෂාංශ හා දේශාංශ අනුව ස්ථානීය තොරතුරු වාර්ෂිකව සෑම පළාත් අධ්‍යක්ෂ කාර්යාලයකටම යැවිය යුතු අතර සෑම පශු වෛද්‍යවරයෙකුම තම කොට්ඨාශයේ ඇති එම තොරතුරු පිළිබඳ දැනුවත් වීම හා මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අනුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
හැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

පිටපත්:

1. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
2. පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා විෂයභාර ලේකම්වරුන් - කා.දැ.ගැ.ස
3. විගණකාධිපති - කා.දැ.ගැ.ස
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
5. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
6. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
7. පළාත් පාලන ආයතන වල ලේකම්/ සභාපති හා ප්‍රාදේශීය සභා ලේකම්/ සභාපති - කා.දැ.ගැ.ස